පවරා දීමේ පටිපාටිය නියම කිරීම ද ඇතුළුව රජයේ නිලධරයන්ට අදාළ සියලු කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම හා ඒ කරුණු තීරණය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලබන්නේ ය.

(5) 126 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලයට යටත්ව, රජයේ නිලධරයකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ගේ විනය පාලනය හා සම්බන්ධ යම්කිසි කාරණයක් පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ හෝ අමාත්‍යවරයකුගේ හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටුවක හෝ රජයේ නිලධරයකුගේ හෝ කිසිම නියමයක් හෝ තීරණයක් විමසීමට, ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ සහ 56 වන ව්‍යවස්ථාවේ සිට 59 වන ව්‍යවස්ථාව තෙක් වූ ව්‍යවස්ථාවල (ඒ ව්‍යවස්ථා දෙකම ඇතුළුව) කාර්ය සඳහා "රජයේ නිලධරයා" යන්නට යුද හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සාමාජිකයෙක් ඇතුළත් නොවන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**56.** (1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපති ලෙස නම් කළ යුත්තේ ය.

(2) යම්කිසි තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම්, ඒ තැනැත්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පත් නොකළ යුත්තේ ය; නැතහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නොසිටිය යුත්තේ ය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්වන තෙක් රජයේ නිලධරයකුව නැතහොත් අධිකරණ නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම, එකී පත්වීම ක්‍රියාත්මක වූ විට එකී ධුරය දැරීම නතර විය යුත්තේ ය. තව ද එවැනි සෑම තැනැත්තෙක් ම රජයේ නිලධරයකු වශයෙන් හෝ අධිකරණ නිලධරයකු වශයෙන් හෝ නැවත පත්වීමට සුදුස්සෙක් නො වන්නේ ය:

එසේ වුව ද එවැනි යම් තැනැත්තකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ, අවස්ථාවෝචිත පරිදි, ඔහු රජයේ සේවකයෙක් නම් නැතහොත් අධිකරණ නිලධරයෙක් නම් යම් වයසකට එළඹි කල්හි ඔහු විශ්‍රාම ගත යුතු යයි නියම කරනු ලැබේ ද ඔහු එසේ සාමාජිකයකුව සිටිය දී එම වයසට එළඹෙන තෙක්, රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස ද රජයේ සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත ධුරයක් දරන ලෙස ද එම සේවය වෙනුවෙන් විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ වෙනත් දීමනා ප්‍රදානය පිළිබඳ වූ යම් විධිවිධානයක කාර්ය සඳහා සැලකිය යුත්තේ ය.